**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**
**<u>මාතර දිස්ත්‍රික්කය.</u>**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 17 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ණයගැතිගේ රු.151,356 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැඟිලි ඉදිකිරීම වෙනුවෙන් වැයකළ රු.2,629,470 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැඟිලි යටතේ ප්‍රාග්ධනිත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | හොරගොඩ පොදු වෙළඳපොළ ගොඩනැගිල්ල හා ඉඩමේ වටිනාකම රු.1,000,000 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ අවසානයට උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ ලැබිය යුතු රු.350,418 ක් කර්මාන්ත ණයගැතියන් යටතේ ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.673,400 ක ප්‍රාග්ධන වැය වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ප්‍රතිපාදන ඇති කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂය ආරම්භක විවිධ ණයහිමි රු.13,792,305 ක ශේෂයෙන්, ප්‍රාග්ධන ණයහිමි ගිණුමට රු.11,587,834 ක් මාරු කිරීමේදී යොදා තිබූ අංක 7 දරන ජර්නල් සටහන සදොස් ලෙස සටහන් කර රු.12,443,631 ක් විවිධ ණයහිමි ගිණුමට හර කිරීම නිසා එම ගිණුමේ ශේෂය රු.855,797 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රාග්ධන ණයහිමි ගිණුමේ අවසාන ශේෂය නිවැරදිය. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ප්‍රතිපාදන ඇති කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩාවේ ඉතිරිව තිබූ රු.765,002 ක් වටිනා ජල උපකරණ තොගය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | හොරගොඩ ජලව්‍යාපෘතිය හා පුවක්දොල හා හොරකැටිය ජලව්‍යාපෘතියේ වටිනාකම තුළ මෙම ජල උපකරණ තොගයේ වටිනාකමද ඇතුළත්ව ඇත. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 93,681,908 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛන අනුව දැක්වෙන ශේෂ අතර එකතුව රු.1,224,861 ක අසමානතා පැවතුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.287,756,251ක් වූ ගිණුම් විෂයයන් 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සමග විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු ගාස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ.571 | රු.1,114,874 ක් වටිනා කල් ඉකුත් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේදී ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ii) | මු.රෙ.1646 | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු වාහන හා යන්ත්‍ර උපකරණ 05 කට අදාලව ඉන්ධන හා නඩත්තුව සඳහා රු.1,745,520 ක් වියදම් දරා තිබුණද එම වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අදාල ධාවන සටහන් හා මාසික සාරාංශ නියමිත පරිදි විගණනයට ඉදිරිපත් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,572,330 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉකම වූ ආදායම රු. 13.884,732 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,594,200 | 1.276,641 | 1,299.332 | 84,998 | 1,569,000 | 1,184,082 | 1,209,492 | 107,689 |
| කුලී | 7,026,400 | 2,597,615 | 2.722,676 | 147,275 | 6,547,600 | 1,922,145 | 1,745,537 | 272,336 |
| බලපත්‍ර ගාස්තු | 566,000 | 655,309 | 583,409 | 87,900 | 639,500 | 786,642 | 787,442 | 16,000 |
| වෙනත් ආදායම් | 27,197,900 | 21,256,688 | 21,061,175 | 49,768,167 | 24,889,800 | 21,811,557 | 11,496,947 | 49,572,654 |
| එකතුව | 37,384,500 | 25,786,253 | 25,666,592 | 50,088.340 | 33,645,900 | 25,704,426 | 15,239,418 | 49,968,679 |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.92,898 ක් වූ අතර, රු.154,196 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.247,094 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.171,287 ක් වූ නිසා වර්ෂය අවසානයට රු.75,807 ක් හිඟව පැවතුණි. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේදී ජංගම සේවා පවත්වා අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ අක්කර බදු මුදල රු.14,867 ක් වූ අතර, වර්ෂයේ රු.4,489 ක බිල් කිරීම් සමග රු. 19,356 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.10,094 ක් වූ නිසා වර්ෂය අවසානයට රු. 9,262 ක් හිඟව පැවතුණි. ආරම්භක හිඟයෙන් සියයට 50 ක් හා බිල්කිරීම්වලින් සියයට 60 ක් වර්ෂය තුළ අයකරගෙන තිබුණි. | හිඟ අක්කර බදු කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේදී ජංගම සේවා පවත්වා අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3 ව්‍යාපාර බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භයට හිඟය රු.16,000 ක් වූ අතර රු.655,309 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.671,309 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.583,409 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.87,900 ක මුදලක් හිඟව පැවතුණි. | ව්‍යාපාර බදු කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**2.2.4 වෙනත් ආදායම්**

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.1,106,257 ක් හා මුද්දර ගාස්තු රු.48,200,867 ක මුදලක් අය විය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තිය ප්‍රකාරව පනවා ගතයුතු අතුරු ව්‍යවස්ථා 30 න් අතුරු ව්‍යවස්ථා 14 ක් පමණක් පනවාගෙන තිබුණි. | පනතේ විධිවිධාන හා ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා (i) – (xix) දක්වා වැළඳගෙන ඇත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතු වේ. | වාර්ෂික අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන් කර ඇති වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2020 ජනවාරි 27 දින පොදු ගබඩාව පිළිබඳ භෞතික පරීක්ෂාවේදී අයිතම 4 කට අදාලව රු.23,436 ක ඌනතාවයක් සහ අයිතම 15 කට අදාලව රු.40,411 ක අතිරික්තයක් පැවතුණි. | ගබඩා පාලන කටයුතු නිසි පරිදි සිදුකළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 06 ක් සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්තව පැවති ද්විතීක තනතුරු 01 අනුමත කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත කාර්යමණ්ඩලයේ තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සවිකර ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 17 කින් 2017 සිට 2019 වර්ෂය දක්වා රු. 351,375 ක් අයකර නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට බදුකරුවන් දැනුවත් කර ඇත. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (2) ප්‍රකාරව බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන, වරිපනම් බල ප්‍රදේශ පුළුල් කිරීමට කටයුතු නොකිරීම නිසා වරිපනම් බදු අයකළ යුතු දේපලවලින් වරිපනම් බදු අයකිරීමට නොහැකි වී තිබුණි. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වරිපනම් බල ප්‍රදේශ සීමාව පුළුල් කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවයක් නොමැති වීම මත වරිපනම් බල ප්‍රදේශ සීමාව පුළුල් නොකරන ලදි. |
| (ඇ) | 2019 වර්ෂය වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් ආයතන 43 ක් මගින් පරිසරයට වන හානිය පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබූ අතර, පරිසර අරක්ෂණ බලපත්‍ර ගාස්තු වශයෙන් රු.189,200 ක් අයකර නොතිබුණි. | බලපත්‍ර ලබාදීමට කටයුතු කළයුතු වේ. | මේ වන විට අය විය යුතු පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමින් සිටිමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දකුණු පළාත් පාලන කොමසාරිස් ගේ අංක ද.ප.ස.15 හා 2007 මාර්තු 19 දිනැති උපදෙස් ලිපිය ප්‍රකාරව සභාව සතු රු.727,688 ක් වටිනා ඉඩම් 03ක් සම්බන්ධව ඉඩම් මැන මායිම් නිවැරදි කරගෙන නොතිබුණි. | උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | මුදල් තත්ත්වය මත ඉදිරියේදී ඉඩම් මැනීම කර මායිම් ලකුණු කිරීමට කයුතු කරමි. |

### 3.5.2 නිෂ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | අනුබෙදීමකදී ප්‍රජා සහ විනෝද කටයුතු සඳහා සභාවට ලැබී තිබූ අක්කර 02 පර්චස් 35.11 ක් වූ ඉඩම් කට්ටි 10 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී වෙන් කරන ලද ඉඩම්වලින් සුදුසු ඉඩම් වගා කටයුතු සඳහා භාවිතා කරමි. |
| (ආ) | 2020 ජනවාරි 28 දිනට වර්ෂ 03 කට වැඩි කාලය තුළ සභාව සතු රු.7,967,400 ක් වටින ගල් රෝලක් 2017 මාර්තු 12 දින සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වා ගත යුතුවේ. | ඉදිරියේදී අලුත්වැඩියා කටයුතු සිදුකර ධාවනයේ යොදා ගැනීමට කටයුතු කරමි. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2018 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ පුවක්දොළ හා හොරකැටිය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජලය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඒ සඳහා මිලදී ගෙන තිබූ රු.765,002 ක ජල උපාංග, 2020 ජනවාරි 27 දින වන විටත් සභාවේ ගබඩාකර තිබුණි. | ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කළයුතු වේ. | ඉදිරියේදී ජල සැපයුම ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය විසින් සිදුකරමින් පවතින අතර 2020 වර්ෂයේ දී ඉතිරි උපාංග ලබා දෙමින් ප්‍රජාව සඳහා ජලය ලබා දීමට හැකියාව ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල දකුණු පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.556,500 ක මුදලක් ලැබී තිබූ නමුත් 2020 ජනවාරි 27 වන විටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කළයුතු වේ. | වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, අදාල ව්‍යාපෘති යෝජනා විටින් විට සංශෝධනය වීම හා සභා රැස්වීම් වලදී ගනු ලබන තීරණ මත ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට ව්‍යාපෘති 05 ක් යටතේ ඉදිකිරීමේ කර්මාන්ත 63 ක් ක්‍රියාත්මක කිරීමට අයවැය මගින් රු11,610,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය මගින් සැලසුම් කර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. | සභික මණ්ඩලය වෙනත් යෝජනා සම්මත කර ගැනීම, කාලගුණික හේතු මත වෙනත් හදිසි යෝජනා ක්‍රියාත්මක කිරීමට සිදුවීම, අයවැය ලේඛනයේ සඳහන් සමහර වැඩ යෝජනා වෙනත් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක වීම හා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම යන හේතූන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූයෙමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළයුතු වේ. | අභ්‍යන්තර විගණකට වෙනත් විෂයයන් පවරා තිබුණි. |

### 4.2 නොවිසඳී ඇති විගණන ඡේද

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.175,644 ක් වටිනා කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රය නිෂ්ක්‍රීයව පැරණි ගම්සභා ගොඩනැගිල්ලේ රඳවා තිබුණි. | ඵලදායී කාර්යයන් සඳහා යොදා ගත යුතු වේ. | වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |